| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය, ආරම්භක ශේෂය, වර්ෂය තුල අත්පත්කර ගැනීම්, අපහරණයන් හා වර්ෂ අවසාන ශේෂයන් සටහන් කිරීමකින් තොරව අසම්පූර්ණව පැවති බැවින් සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ වටිනාකම වූ රු.927,651,125 ක ශේෂයෙහි නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කල යුතු වීම. | වර්ෂය තුල ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර 2018 මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සටහන් කර ඇත. තව ද, 2018 වර්ෂයට අදාළ අබලි භාණ්ඩ මිළ ගණන් කැඳවා විකිණීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. |
| (ඇ) | අංක MF/CG/02/(Cir) හා 2017 ජුනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව සෑම | අංක MF/CG/02/(Cir) හා 2017 ජුනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය | අංක MF/CG/02/(Cir) හා 2017 ජුනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය චක්‍රලේඛ අනුව අප |

| | | |
|---|---|---|
| රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතන යටතේ වන සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා යටතේ ඇති දෙපාර්තමේන්තුවට අදාල වත්කම්වල වටිනාකම ශුන්‍ය වුවද ගිණුමෙහි දක්වා ඇති වත්කම්වල වටිනාකම රු.927,651,125 කි. ඒ අනුව රු.927,651,125 ක වෙනසක් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතන යටතේ වන සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වීම. | ආයතනයේ සියලුම මූලා නොවන වත්කම් ගිණුම් ගත කර එම සම්පූර්ණ ආකෘති පත්‍ර වල මෘදු පිටපත් එහි සඳහන් විද්‍යුත් ලිපිනයට යොමුකර ඇත. සිගාස් වැඩසටහනෙහි මෘදු පිටපතක් විද්‍යුත් තැපැල මඟින් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශයට ඇතුලත් කිරීම සඳහා එම ආයතනය වෙත යොමු කරන ලදි.නමුත් 2019 පරිගණක ගිණුම් පිටපත් වල අප ආයතනයේ ස්ථාවර වත්කම් වටිනාකම් ශුන්‍ය අගයක් ගෙන තිබුණි. මේ වන විට මැයි මස ගිණුම් සාරාංශ මගින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ - අත්තිකාරම් “බී” ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුම් ශේෂය අතර රු.369,570 ක වෙනසක් දැක්වෙන අතර ඉන් රු.299,615 වෙනසට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොවුණි. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුම් ශේෂය සමග සැසඳීම් කල යුතු වීම. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය හා සැසඳීමේදී රු.369,570.47 ක වෙනසක් විය. ඉන් රු.69,955.35 ක් 310011 ශීර්ෂය යටතේ වැරදියට බැර කල වැඩිපුර ගෙවූ වේතන වන අතර රු.299,615 ක් වන ශේෂය 2019 වර්ෂය තුළදී අනාවරණය කර ගෙන 2019 අවසන් ගිණුම්වල දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් අයකර ගත යුතු ණය ශේෂවල එකතුව රු.1,096,212 ක් ද සේවයෙන් පහකළ නිලධාරින් දෙදෙනෙකුගේ ණය ශේෂවල එකතුව රු.261,150 ක්ද වන අතර ඉන් | කඩිනමින් ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සේවය අතහැර ගිය නිලධාරින්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් ණය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීම් සිදු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂ 05 ට වැඩි කාලයක් සිට අයවීම් හිඟහිටව ඇති ණය ශේෂ පැවතිය ද එම ණය ශේෂ අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) | විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් එකතුව රු.891,395 ක්ද මියගිය නිලධාරින්ගෙන් එකතුව රු.108,350 ක්ද වූ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අය කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. |
| (ඇ) | විධිමත් පරිදි ලේඛන පවත්වා නොගැනීම හේතුවෙන් රු.32,630 ක ණය ශේෂ අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | මුදල් රෙගුලාසි 156 (6) අනුව ගිණුම් පිලිබඳව වූ සියලුම ලිපිලේඛන, පොත් පත්, වාර්තා සටහන්, ලේඛන යනාදිය විධි වූ පරිදි බැහැර කරනු ලබන තෙක් නිසි පිළිවෙලට හා මනා තත්වයෙන් සුරක්ෂිත භාරයේ තබා ගත යුතු වීම. | පුද්ගලයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ වල එකතුව රු.32,630 කි. ණය ගොනු අස්ථානගත වීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධ වාර්තාවන්, වගකිවයුතු නිලධාරීන් තීරණය කිරීම සඳහා පදනම් කරගත හැකි ප්‍රමාණවත් තොරතුරු නොමැති වීමද පිළිබඳ කරුණු ඇතුලත් කරන ලද වාර්තාවක් 2018 ඔක්තෝබර් 05 දින සහකාර අධ්‍යක්ෂ (පාලන) විසින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව කමිටු වාර්තාවක් ලෙස සකස්කර එය සලකා බලා ලිපිගොනු අස්ථානගත වීමට වගකිව යුතු නිලධාරියා තවදුරටත් සොයා බලා අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි. |

**1.6.3 ගබඩා අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අවශ්‍ය යළි ඇණවුම් තොග මට්ටම හා (Re-Order Level), ආරක්ෂිත | අවශ්‍ය තොග මට්ටම් පවත්වා ගැනීමට කටයුතු කල යුතු වීම. | මණ්ඩලයක් විසින් ගැණුම් මට්ටම් තීරණය කර එහි පිටපත් ගබඩා කාර්ය මණ්ඩලය |

| | | |
|---|---|---|
| තොග මට්ටම (Buffer Stock Level) පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | | වෙත නිකුත් කර ඇත. |

### 1.6.4 කළවැඩ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ අතිරික්තය රු.12,171,726 ක් වූ අතර එම ශේෂය කළවැඩ අත්තිකාරම් ගිණුමේ පිරිවැයෙන් අඩුකර දක්වා තිබීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කළවැඩ අත්තිකාරම් ගිණුමේ නිවැරදි ශේෂය දැක්විය යුතු වීම. | මිලට ගත් තොගය ගබඩා කිරීමට හා මෙහෙයුම් කටයුතු සඳහා යන වියදම් වෙනුවෙන් පිරිවැයට සියයට 10 ක් එකතු කොට නිකුත් කිරීම කරනු ලැබේ. ඒ අනුව ගබඩා අත්තිකාරම් ගිණුමේ අතිරික්තයක් හෝ ඌණතාවයක් පෙන්නුම් කරන අතර එම අතිරිතික්තය හෝ ඌණතාවයක් ගබඩා ද්‍රව්‍ය ගැනුම් ගිණුමේ දැක්වෙන හෙයින් එම ශේෂය කලවැඩ අත්තිකාරම් ගිණුමේදී ද්‍රව්‍ය පිරිවැයෙන් අඩු කර දක්වයි. ඒ අනුව කලවැඩ අත්තිකාරම් ගිණුමේ අතිරික්තය සාධාරණීයකරණය කිරීමට හේතුවේ. |
| (ආ) | ණයගැති ශේෂය රු.640,594,032 ක් වූ අතර ගිණුම සමග ඉදිරිපත් කරන ලද උපලේඛන එකතුව රු.555,309,139 ක් විය. ඒ අනුව රු.85,284,893 ක ණයගැතියන් සඳහා උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සියලු ණයගැතියන් සඳහා උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු වීම. | 2015 වර්ෂයට පෙර සිට පැවති හා රු.85,284,890.01 ක්වූ ණයගැති ශේෂ සැසඳීමට අනුව කපා හැරීමට නියමිත වුවද කපා හැරීමට එකඟතාවයකට පැමිණ නොමැත. |
| (ඇ) | 2008 හා 2009 වර්ෂයන්හි ණයගැති ශේෂය රු.66,578,654 | ණය ගැති ශේෂය අඩුවීමට හේතු පරීක්ෂා | 2008 හා 2009 ණයගැති ශේෂ වැඩ අංශය සමඟ සැසඳීමකින් තොරව මෙම |

| | | | |
|---|---|---|---|
| | ක්වූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී කිසිඳු ණයගැතියෙකුගෙන් මුදල් අයවී නොතිබුණද එම ණයගැති ශේෂය රු.29,637,100 කින් අඩුවෙන් දක්වා තිබුණි. | කර නිවැරදි ශේෂය ගිණුම්වල දැක්විය යුතු වීම. | වසරේදී නිවැරදි ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව එම ණයගැති ශේෂ වැඩ අංශය සමඟ සැසඳීමෙන් පසු 2008 හා 2009 වර්ෂ සඳහා ණයගැති ශේෂය රු.36,941,553.75 ලෙස තහවුරු විය. (66,578,654 - 29,637,100 = 36,941,554) |
| (ඇ) | කර්මාන්තශාලාව විසින් ගිණුම් කාලපරිච්ඡේදය තුල සම්පූර්ණ නොකල කාර්යයන් **(Job)** සඳහා දරන ලද පිරිවැයට ඉන්වොයිස් නිකුත් කිරීමෙන් ඉතිරි වැඩවල පිරිවැය නොනිමි තොගය ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් පරීක්ෂා කරන ලද නියැදි කාර්යයන් **(Job)** අතුරින් කාර්යයන් 10 කට අදාල රු.92,828,431 ක නොනිමි වැඩ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | වැඩ අවසන් නොවූ කාර්යවලට අදාල නොනිමි වැඩ නිවැරදිව ගණනය කර ගිණුම්වල දැක්විය යුතු වීම. | සියළුම කාර්යයන් ( Job ) සඳහා ලැබිය යුතු සම්පූර්ණ මුදල් ගිණුම් කාලපරිච්ඡේදය තුල අයකරගෙන ඇති නමුත්, එම වර්ෂය තුල අවසන් කිරීමට නොහැකිව ඉතිරි වූ කාර්යයන්ගේ වටිනාකම ණය හිමියෙකු ලෙස සළකා ඊළඟ වර්ෂය සඳහා ඉදිරියට ගෙනැවිත් ඇත. එසේ කර ඇත්තේ අවසන් නොවුනු වැඩ ඉටුකරදීම සඳහා ඉතිරිව ඇති නිසාය. වර්ෂ අවසාන ගිණුම සකස් කිරීමේදී සියළුම කාර්යයන් සඳහා නිකුත් කරන ලද ඉන්වොයිස් වටිනාකම ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ විකුණුම් ලෙස සළකා ගිණුම් ගත කර ඇති බැවින්, ඒවා නොනිමි වැඩ ලෙස සැළකිය නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම, එකී කාර්යන් සඳහා ඉදිරි වර්ෂ වල නැවත ඉන්වොයිස් නිකුත් කිරීමක් සිදු නොකරයි. |
| (ඉ) | 2018 අගෝස්තු 02 දිනැති රු.5,265,360 ක්වූ ණයට විකුණුම් ඉන්වොයිසියක් අවලංගු කර වෙනත් විකුණුම් ඉන්වොයිසියක් යටතේ රු.1,005,360 ක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව විකුණුම් වටිනාකම රු.4,260,000 කින් වැඩියෙන් දැක්වුනි. | අවලංගු කල විකුණුම් ඉන්වොයිසියට අදාල තොරතුරු නිවැරදිව ගිණුම්වලට ඇතුළත් කළ යුතු වීම. | ණයට විකුණුම් ඉන්වොයිසිය අතපසු වීමකින් මුදලට විකිණීමක් ලෙස සටහන් වී ඇති අතර එම ඉන්වොයිසිය අවලංගු වීම ලෙජරයට සටහන් වී නොමැත. ඒ අනුව එම මුදල අවසන් ගිණුමේ විකුණුම් ලෙස දැක්වෙන හෙයින් ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කළවැඩ අත්තිකාරම් ගිණුමේ නිමි තොග ශේෂය රු.43,758,842 ක් වුවද එම තොගය සමීක්ෂණය කර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුනි. | තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | රු.425,550,288 ක මුදල සෘජු වියදම් වේ. එය සකස් වී ඇත්තේ වසර මුල නිෂ්පාදිත තොගයට නිෂ්පාදන පිරිවැය එකතු කර වසර අග නිෂ්පාදිත තොගය අඩු කිරීමෙනි. වසර මුල තොගය පෙර වර්ෂයේ අග තොගය වන අතර, වසර අග තොගය සඳහා වාර්තාව ගිණුම සමග ඉදිරිපත් කර ඇති අතර, ඔබගේ අවධානය සඳහා එහි පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි. |
| (ආ) | රු.317,940,622 ක්වූ ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවුනි. | වත්කම් ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වීම. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කරමින් පවතී. එය 2019 වසරේ අවසන් ගිණුම සමග ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. |
| (ඇ) | බැංකු සැසඳුම අනුව හඳුනා නොගත් ලැබීම්වල වටිනාකම රු.13,665,482 ක් හා හඳුනා නොගත් ගෙවීම්වල වටිනාකම රු.1,132,178 ක් වුවත් එම ශේෂ තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි. | අදාල ශේෂ තහවුරු කර නිරවුල් කල යුතු වීම. | වර්ෂ අවසාන බැංකු සැසඳුම අනුව රු.13,665,482 ක් වූ හඳුනා නොගත් ලැබීම් හා රු.1,132,178 හඳුනා නොගත් ගෙවීම් නිසි පරිදි නිරවුල් කිරීම සඳහා අවශ්‍ය මුදල් පොතේ ගැළපීම් සිදුකිරීමට උපදෙස් සපයා ඇත. තවදුරටත් පවතින හඳුනා නොගත් ලැබීම් මෙන්ම හඳුනා නොගත් ගෙවීම් නිරවුල් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. |

## 1.6.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අංක CEN/A/ GF/ AQ/18/11 හා 2019 අප්‍රේල් 30 දිනැති ලිපිය අනුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව තුල මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට සහතික වීම සඳහාත්, එම පද්ධතිය සමාලෝචනය කිරීමට හා අවශ්‍ය වෙනස්කම් කිරීමට අදාළ තොරතුරු ලබාගැනීම සඳහා සියළුම අංශ ප්‍රධානීන්ගෙන් තොරතුරු කැඳවා ඇත. එම තොරතුරු ලද පසු අදාළ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

### 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06(i) , (ii) සහ 07 | කාර්තුව තුළදී අලුතින් එකතුවූ වාහන, වාහන අපහරණය කිරීම්, ඇතුළුව වෙනත් වෙනස්වීම් පිළිබඳ තොරතුරු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවද එසේ කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කල යුතු වීම. | අංක 01/2016 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇත. |

(ආ) 2006 **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**
**---------------------------**

| | | | |
|---|---|---|---|
| (i) 4.2.1 ඡේදය | (ඉ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය යුතු වුවත් එසේ කර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ අවශ්‍ය යාවත්කාලීන කිරීම් කල යුතු වීම. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනවලට අදාල මිලදී ගැනීම් සහ සේවාවන් පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කරනු ලබන අතර එම සැලැස්ම වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.<br>තවද උපකොන්ත්‍රාත්තු සඳහා වූ ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන කාලසටහන් (PTS) සකස්කරනු ලැබේ. එම කාල සටහන් වලට අනුව ප්‍රසම්පාදනයන් කරගෙන යනු ලැබේ. |
| (ii) 5.4.12 ඡේදය | එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු නමුත් එසේ කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය අනුව කටයුතු කළ යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 ඡේද අංක 5.4.12 අනුව ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (iii) 7.8.4 (එ) ඡේදය | තාක්ෂණික පිරිවිතරවල වෙනස්කම් සිදුවී තිබියදී රු.8,682,500 ක ගෙවා රේල්පිලි මිලදී ගෙන තිබුණි. | තාක්ෂණික පිරිවිතර අනුව භාණ්ඩ මිලදී ගැනීම් කළ යුතු වීම. | මීටර් 9 කැබලි 75 ක් වෙනුවට වෙනුවට මීටර් 10 කැබලි 68 ක් මිල දී ගැනීමෙන් පිරිවිතරවල වෙනසක් සිදුවී නොමැත. මුළු දිග ප්‍රමාණය මීටර් 05 කින් වැඩිවී ඇත. අදාල කාර්යය සඳහා රේල් පීලි කැබලිවල දිග වැඩිවීමෙන් පැස්සුම් සම්බන්ධතාවයන් අඩුවන බැවින් එය අමතර වාසියක් විය. |
| (ඇ) | අංක 248/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය පරිදි කාර්තුමය වශයෙන් ගැලපූ එකතු කළ අගය මත බදු අගයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.236,237,870 ක් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | එකතු කල අගය මත බදු ගෙවීම් නියමිත දින වකවානුවල කළ යුතු වීම. | එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු.236,237,879.63 ක් ලෙස ගිණුම්වල දැක්වුවද වැට් බදු ගිණුම්ගත කිරීම නිසි පරිදි සිදු වේ. එහෙත් වැට් බදු ගෙවීම් කටයුතු සිදු කිරීමේදී වෙනත් ක්‍රමයකට වැට් බදු ගණනය කිරීම හේතුවෙන් මෙම ශේෂය ඇතිවන බව පෙන්වා දිය හැකි වේ. |

**1.6.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 395 අනුව එක් බැංකු ගිණුමකට අදාලව බැංකු සැසඳුම පිළියෙළ කර ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 395 අනුව බැංකු ගිණුම් පිලියෙල කල යුතු වීම. | මු.රෙ. 395 අනුව බැංකු ගිණුම් අංක 7042705 සඳහා බැංකු සැසඳුම පිළියෙල කර නොතිබුණු අතර, ඉදිරියේදී අදාළ බැංකු සැසඳුම් නියමිත පරිදි පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය** **නිර්දේශය** **ගණන්දීමේ නිලධාරීගේ අදහස්**

| | | | දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු රු.305,450,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් රු.1,63,901,169 ක් උපයෝජනය කර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 54 ක් විය. රු.204,500,000ක් වූ මූලධන ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් රු.1,63,901,169 ක් උපයෝජනය කර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 80 ක් විය. | මූලධන ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් එම වර්ෂය තුල උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | මූල්‍යාම ප්‍රගතිය රු.මිලියන 27.22 ක් වුවද භෞතික ප්‍රගතිය 124.71 (ප්‍රසම්පාදන) ක් විය. ප්‍රතිශතයක් ලෙස සියයට 94 කි.<br>මූල්‍යාම ප්‍රගතිය රු.මිලියන 124.71 ක් එනම් සියයට 94 ක් දක්වා ලඟාකර ගැනීමට නොහැකිවීමට හේතුවූ ප්‍රායෝගික ගැටළු තිබුණි. |
| (ආ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී වියදම් නිශ්චිතව හා පැහැදිලිව හඳුනා නොගැනීම නිසා වැය විෂයන් 05 ක අවශ්‍යතාවයන්ට වඩා සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. | ප්‍රතිපාදන අවශ්‍යතාවයන් තීරණය කර ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම් කල යුතු වීම. | අපේක්ෂිත මූල්‍යමය සහ භෞතික ප්‍රගතීන් කරා ලඟා වීමට නොහැකි වීමට හේතු වූ ප්‍රායෝගික ගැටළු තිබුණි. |
| (ඇ) | මූලික වියදම් ඇස්තමේන්තු හා තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 300 දක්වා ඉතිරිවීම් නිරීක්ෂණය විය. | වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කල යුතු වීම. | මු.රෙ. 66 මාරු කිරීම් 2018 වර්ෂයේ අවස්ථා 3 කදී මහා භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතිය මත සිදුකරන ලදී. ප්‍රතිපාදන ඉතිරි වී තිබූ වැය විෂයයන්, ප්‍රතිපාදන තවත් අවශ්‍ය වූ වැය විෂයයන් සඳහා මු.රෙ. 66 මගින් අවස්ථා 3 කදී මාරු කරන ලදි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

----------------

2018 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------------------- |

| | | | |
|---|---|---|---|
| (අ) | කාර්යසාධන වාර්තාවේ ඉටුකරගත් අරමුණු, අනාගත අපේක්ෂා, ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්පත් භාවිතා කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය දක්වා නොතිබුණි. | කාර්යසාධන ප්‍රගතිය දැක්විය යුතු වීම. | ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ සම්පත් භාවිතා කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය යටතේ දක්වා ඇත. |
| (ආ) | අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂ අවසානයේ ප්‍රගතිය භෞතික හා මූල්‍යමය වශයෙන් සංසන්දනය කර ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව භෞතික හා මූල්‍යමය වශයෙන් සංසන්දනය කර ඉදිරිපත් කළ යුතු වීම. | වාර්ෂික කාර්යය සාධන වාර්තා සකස් කිරීමේදී ලබා ඇති ප්‍රගතිය හා විශ්ලේෂණයන් ද. භෞතික කාර්යය සාධනය ද ඊට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | අයවැය හා සත්‍ය වියදම් විශ්ලේෂණයක් සහ ඊට අදාල භෞතික කාර්යසාධනය ඉදිරිපත් කර නොතිබුණි. | භෞතික කාර්යසාධනය ඉදිරිපත් කළ යුතු වීම. | භෞතික කාර්යය සාධනය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය යටතේ දක්වා ඇත. වෙනම වාර්තාවක් වශයෙන් ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 5/2016 ට අනුව 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2019 මාර්තු 17 වන දිනට පෙර විගණකාධිපති වෙත යවා, 2019 මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දීම කළ යුතු වුවත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත එවීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් අදියරේ පවතින බැවින්, 2019 ජූනි 15 දිනට පෙර සියළුම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. එමෙන්ම, ඊළඟ වර්ෂයේ දී රා.මු.ච.ලේ. 5/2010 ට අනුව මාර්තු 31 ට පෙර අදාළ කාර්යය නිම කිරීමට බලාපොරොත්තු වෙමි. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට රු.640,594,032 ක් වූ ණයගැති ශේෂවල එකතුව අවුරුදු 20 ට වැඩි කාලයක ශේෂයන් වේ. | ණයගැති ශේෂයන්ගේ කාලවිශ්ලේෂණය අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | එම ණයගැති ශේෂ සඳහා නැවත සිහි කැඳවීම් ලිපි යැවීමට කටයුතු කරන අතර ණයගැති ශේෂ නොමැති බවට දැනුම් දී ඇති ආයතනවල ශේෂයන් සඳහා ඉදිරියේදි විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) 1995 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් රු.32,550,371.85 ක මුදලක් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට අයවීමට ඇති බැව් විගණනයේ දී නිරීක්ෂණය විය | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම | මෙම ණය ශේෂ සම්බන්ධයෙන් තොරතුරු අමාත්‍යාංශය වෙත යවා ඇති අතර ඉදිරියේදි එම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 4. යහපාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය කිරීමේ දී විශේෂ කාර්යභාරයක් ඉටු කිරීම සඳහා රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම යටතේ වූ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 25/2018 දරන 2018 ජුනි 11 හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක PED/INF/123/000/CM/389 දරන හා 2018 ජුනි 22 දිනැති ලිපි ප්‍රකාරව පත්කල විද්වත් කමිටුවේ වාර්තාව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | විද්වත් කමිටුවේ වාර්තාව නොපමාව ලබා ගැනීමට කටයුතු කල යුතු අතර වාර්තාව ප්‍රකාරව ප්‍රතිසංවිධාන කටයුතු සැලසුම් කල යුතු වීම. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය කිරීමේදී විශේෂ කාර්යයභාරයක් ඉටුකිරීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් පත්කල විද්වත් කමිටුවේ වාර්තාව මේ දක්වා ලබා දී නොමැති අතර, අදාළ වාර්තාව නිකුත් වූ වහාම එහි පිටපතක් ලබාදීමට කටයුතු කරමි. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 330 ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ දී මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ඒ වෙනුවට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වැටුප් ගෙවනු ලබන නිලධාරින් 04 දෙනෙකු 2017 අප්‍රේල් සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ රාජකාරි කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වීම හෝ අතිරික්ත තනතුරු වේ නම් ඒවා අහෝසි කිරීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අමාත්‍යාංශයට හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයාට අවශ්‍ය පරිදි ලිපි යොමු කර ඇති අතර සමහර බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව කටයුතු කරමින් පවතී. |

# 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| කළ වැඩ අත්තිකාරම් | | | √ |
| ප්‍රාග්ධන වියදම් | | √ | |

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| පිරිසුදු ජලය හා සනීපාරක්ෂාව | 100% | | | | √ |
| පුනර්ජනනීය බල ශක්තිය භාවිතය | 100% | | | | √ |
| LED විදුලි ලාම්පු භාවිතය | 100% | | | √ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- විදුලි හා ජල විගණනය සඳහා ගොඩනැගිලි/ වැඩහල් සඳහා ජල මීටර්/ විදුලි මීටර් සවි කිරීම.
- Mercury (රසදිය) හා CFL භාවිතය හා මිල දී ගැනීම අවම කරමින් LED/ සූර්ය පැනල භාවිතය දිරිගැන්වීම.
- කසළ කළමණාකරනය.
- දිවා කාලයේදී ආලෝකමත් කිරීමට හැකිතාක් සූර්යාලෝකය භාවිතා කිරීම.
- හරිත ගොඩනැගිලි සංකල්පය සඳහා සූදානම් වීම.
- තාප්පය වටා සහ ඇතුලත සූර්ය බලශක්ති විදුලි ලාම්පු සවි කිරීමට කටයුතු කරමින් පවතී.

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෝෂ්ඨ | 31 | 21 | 10 |
| තෘතියික | 10 | 04 | 06 |
| ද්විතියික | 197 | 114 | 83 |
| ප්‍රාථමික | 552 | 293 | 259 |
| **එකතුව** | **790** | **431** | **360** |

## 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම

- ප්‍රාථමික ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 552ක් වන අතර 259ක පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී.
- විධායක හා ද්වීතික ශ්‍රේණිවල නිලධාරී ඌණතාවය හේතුවෙන් විෂයන් කීපයක් භාර දී ඇත. එහිදී ඒ ඒ කාර්යයන්හි කාර්යක්ෂමතාවයට බලපෑම් සිදු වී ඇත.
- එකවර ව්‍යාපෘති කීපයක කටයුතු කිරිමට සිදුවීමේදි කාර්ය මණ්ඩල ඌනතාවය මහත් බලපෑම් ඇති කරයි.
- පවත්නා නිෂ්පාදන කාර්යයන්ට හා ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන්ට වැටුප් හ වේතන ගෙවනු ලබන්නේ දෙපාර්තමේන්තු කළ වැඩ අත්තිකාරම් ගිණුමෙන් වන බැවින් එම මූල්‍ය ශක්තිය ද සලකා බලා බඳවා ගැනීම් කරනු ලැබේ

## 6.3 අනුමත කාර්යය මණ්ඩලය, පුරප්පාඩු හා අතිරික්ත

| විස්තරය / තනතුර හා මට්ටම | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව ස්ථිර | දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව ස්ථිර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලං.ඉ.සේ. | 01 | 01 (වැ.බ.) | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලං.ඉ.සේ. | 01 | 0 | 01 |
| අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ඉ.සේ. | 03 | 02 | 01 |
| ප්‍රධාන ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 05 | 02 | 03 |
| අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලං.ප.සේ. | 01 | 0 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ල.ග.සේ. | 01 | 01 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. | 01 | 01 | 0 |
| නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලං.ප.සේ. | 01 | 01 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං.තො.හා සන්.තා.සේ. | 01 | 0 | 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 11 | 10 | 01 |
| විදුලි ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 01 | 0 | 01 |
| සිවිල් ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 01 | 01 | 0 |
| ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | 02 | 02 | 0 |
| නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | 01 | 0 | 01 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකතුව** | | **31** | **21** | **11** |
| **තෘතියික මට්ටම** | | | | |
| පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | 01 | 01 | 0 |
| ප්‍රධාන සැලසුම් ශිල්පී | ශ්‍රී ලං.තා.සේ. | 01 | 01 | 0 |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී | ශ්‍රී ලං.තා.සේ. | 07 | 02 | 05 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං.තො.හා සන්.තා. සේ. | 01 | 0 | 01 |
| **තෘතියික මට්ටමේ එකතුව** | | **10** | **04** | **06** |

| විස්තරය / තනතුර හා මට්ටම | අදාල වන සේවය | අනුමත තනතුරු | දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | ස්ථිර | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.හා සන්.තා. සේ. | 07 | 01 | 06 |
| සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය | 15 | 10 | 05 |
| නීති සහකාර | ආශ්‍රිත නිලධාරී | 01 | 01 | 0 |
| සැලසුම් ශිල්පී | ශ්‍රී ලං.තා.සේ. | 05 | 01 | 04 |
| යාන්ත්‍රික අධිකාරී | ශ්‍රී ලං.තා.සේ. | 25 | 12 | 13 |
| විදුලි අධිකාරී | ශ්‍රී ල.තා.සේ. | 01 | 0 | 01 |
| සිවිල් අධිකාරී | ශ්‍රී ලං.තා.සේ. | 01 | 0 | 01 |
| ප්‍රමාණ සමීක්ෂණ සහකාර | දෙපාර්තමේන්තුගත | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | 60 | 48 | 12 |
| වැඩහල් පරිපාලක | දෙපාර්තමේන්තුගත | 35 | 20 | 15 |
| වැඩහල් සහකාර | දෙපාර්තමේන්තුගත | 21 | 09 | 12 |
| වැඩහල් ලිපිකරු | දෙපාර්තමේන්තුගත | 12 | 06 | 06 |
| කාලසණක ලිපිකරු | දෙපාර්තමේන්තුගත | 12 | 05 | 07 |
| **ද්විතියික මට්ටමේ එකතුව** | | **197** | **113** | **84** |
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | 15 | 11 | 04 |
| බර වාහන ක්‍රියාකරු | දෙපාර්තමේන්තුගත | 14 | 0 | 14 |
| කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය | 16 | 12 | 04 |
| සනීපාරක්ෂක කම්කරු (PL 1) | දෙපාර්තමේන්තුගත | 06 | 02 | 04 |
| ප්‍රාථමික ශිල්පීය (PL 3) | දෙපාර්තමේන්තුගත | 250 | 133 | 117 |
| ප්‍රාථමික ශිල්පීය / ප්‍රාථමික අර්ධ ශිල්පීය ( PL 2) | දෙපාර්තමේන්තුගත | 157 | 76 | 81 |
| ප්‍රාථමික ශිල්පීය නොවන PL 1 | දෙපාර්තමේන්තුගත | 88 | 60 | 28 |
| ප්‍රාථමික ශිල්පීය නොවන (බර පටවන්නා) | දෙපාර්තමේන්තුගත | 06 | 0 | 06 |
| **ප්‍රාථමික මට්ටමේ එකතුව** | | **552** | **293** | **259** |
| මුළු එකතුව | | 790 | 431 | 360 |

## 6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන ආකාරය

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | පුහුණු කිරීම් වර්ගය (දේශිය,විදේශිය) | පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 1. | ඩීසල් උත්පාදක යන්ත්‍ර නඩත්තු කිරීම | 02 | දින 01 | 29,820/= | දේශිය | සතුටුදායකයි |
| 2. | ග්‍රැෆික් නිර්මාණ පාඨමාලාව | 07 | දින 20 | 240,000/= | දේශිය | සතුටුදායකයි |
| 3. | CNC පුහුණු පාඨමාලාව | 08 | දින 30 | 204,000/= | දේශිය | සතුටුදායකයි |
| 4. | ජලනල තාක්ෂණය පිළිබඳ වැඩමුලුව | 03 | දින 01 | 10,500/= | දේශිය | සතුටුදායකයි |
| 5. | ආරක්ෂිත,විද්‍යාත්මක වාහන භාවිතය පිළිබඳ වැඩමුලුව | 05 | දින 01 | 25,000/= | දේශිය | සතුටුදායකයි |
| 6. | ඇලුමිනියම් පිරිසැකසුම් පාඨමාලාව | 11 | මාස 03 | 358,000/= | දේශිය | සතුටුදායකයි |
| 7. | ප්‍රවාහන කළමනාකරණය | 01 | දින 02 | 7000/= | දේශිය | සතුටුදායකයි |
| 8. | ව්‍යාපෘති කළමනාකරණ පාඨමාලාව | 03 | දින 20 | 66,000/= | දේශිය | සතුටුදායකයි |
| 9. | සුපිරි ගොඩනැගිලිවල ව්‍යුහාත්මක සැලසුම් පිළිබඳ පූර්ව සම්මන්ත්‍රණ වැඩමුලුව | 01 | දින 03 | 15,000/= | දේශිය | සතුටුදායකයි |
| 10. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 10 | 45,000/= | දේශිය | සතුටුදායකයි |
| 11. | කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 04 | 15,000/= | දේශිය | සතුටුදායකයි |
| 12. | ව්‍යාපෘති කළමනාකරණ Primavera p6 | 02 | දින 04 | 40,000/= | දේශිය | සතුටුදායකයි |
| 13. | පුද්ගලික ගොනු | 03 | දින 02 | 25,500/= | දේශිය | සතුටුදායකයි |
| 14. | දේපළ / උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම, නඩත්තු කිරීම පිළිබඳව පුහුණු පාඨමාලාව | 02 | දින 01 | 10,000/= | දේශිය | සතුටුදායකයි |

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | පුහුණු කිරීම් වර්ගය (දේශිය,විදේශිය) | පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 15. | වැටුප් ක්‍රියාවලිය | 02 | දින 03 | 36,000/= | දේශිය | සතුටුදායකයි |
| 16. | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම් | 03 | දින 01 | 9000/= | දේශිය | සතුටුදායකයි |
| 17. | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම් | 01 | දින 02 | 8500/= | දේශිය | සතුටුදායකයි |
| 18. | CEEP ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | 05 | මාස 03 | 125,000/= | දේශිය | සතුටුදායකයි |
| 19. | බඳවා ගැනීමේ පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 02 | 8,500/= | දේශිය | සතුටුදායකයි |
| **20.** | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | 01 | අවුරුද්දයි | 200,000/= | දේශිය | සතුටුදායකයි |
| **21.** | අල්ලස් හා දූෂණයට එරෙහිව සටන් කිරීමේදි මූල්‍ය වෘත්තිකයාගේ කාර්යභාරය | 01 | දින 01 | 2750/= | දේශිය | සතුටුදායකයි |
| **22.** | මූල්‍ය ප්‍රකාශ කියවීම සහ අවබෝධ කර ගැනීම | 01 | දින 02 | 8500/= | දේශිය | සතුටුදායකයි |
| **23** | රාජ්‍ය ද්විතියික වෘත්තිය ගණකාධිකාරිවරුන්ගේ සදාචාරාත්මක වගකීම | 01 | දින 01 | 1500/= | දේශිය | සතුටුදායකයි |
| **24.** | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව | 01 | අවුරුද්දයි | 120,000/= | දේශිය | සතුටුදායකයි |
| | **මුළු එකතුව** | **67** | | **1,610,570/=** | | |

# 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවිම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල වේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරිම ( මූ.රෙ.445 )** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල නොවේ. | | 2020 වර්ෂය දක්වා බැරකම් ලේඛනය සකස් කර මාසිකව පරීක්ෂා කළ යුතු ය. |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 05 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 06 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) dma/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 07 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍ර ලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 08 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |
| 09 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව, කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ. | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවකටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනිමට යොජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ. | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | | 2020 වර්ෂයේ සිට සෑම මසකම ශේෂයන් පරීක්ෂා කර ඒවා පියවා ගැනීමට කටයුතු කරනු ඇත. |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබද මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබිම | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවස්ථාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනිමට යොජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරිම හා ක්‍රියාත්මක කිරිමේ කටයුතු අධික්ෂණය කිරිම හා ඇගයිම් සදහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබිම | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරිම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබිම | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබිම | අනුකූල නොවේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම | අනුකූල නොවේ. | | |
| 19.4 | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරිම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරිම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම පිළිබඳ වගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබිම | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්විම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබිම | අනුකූල වේ. | | |

## 7.1 අභ්‍යන්තර විගණන අංශය

**දැක්ම:**

යාන්ත්‍රික ඉංජිනේරු නිෂ්පාදන සහිත දෙපාර්තමේන්තුවකට මූල්‍ය විනයෙන් යුත් ඉදිරි ගමනක් සඳහා විගණනය මඟින් අත්වැලක් ලබා දීම.

**අරමුණු:**

දෙපාර්තමේන්තුවේ පවතින මූල්‍ය ,මානව සම්පත් ඇතුලුව අනෙකුත් ආර්ථික සම්පත් වඩා කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුක්තව මෙන්ම පවතින රාජ්‍ය නීති රීති හා උපදෙස් ප්‍රකාරව දෙපාර්තමේන්තු අරමුණු සඳහා යොදවා ගන්නේ ද යන්න පිලිබඳව සොයා බලා දෙපාර්තමේන්තු ප්‍රධානි වෙත හා අනෙකුත් සම්බන්ධිත විගණන පාර්ශවයන් වෙත වාර්තා කිරීම.

ඒ යටතේ දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් වන පරිපාලන හා මෙහෙයුම් කාර්යයන් හා සම්බන්ධ වැඩහල් පද්ධතිය හා පරිපාලනමය කාර්යයන් ඉටු වන ඊට අදාළ උප ඒකකයන්වල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා යහපත් මූල්‍ය පරිපාලනය , කළමනාකරණ කටයුතුවල කාර්යක්ෂමතාවය ඇගයීම , උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීම.

**ප්‍රධාන කාර්යයන් :**

- දෙපාර්තමේන්තුවේ එකිනෙක අංශවල විගණන කටයුතු සිදු කිරීම තුළින් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා එමඟින් පවතින ගැටළු අවම කිරීමට කටයුතු කිරීම.
- හදිසි විමර්ශනමය කාර්යයන් ඉටු කිරීම.
- විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කාර්යන් සිදු කිරීම.
- අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශය සමග සම්බන්ධීකරන කාර්යයන් සිදු කිරීම.

**<u>2019 වාර්ෂික ප්‍රගතිය :</u>**

2019 වර්ෂයේ විගණන සැලැස්ම අනුව විගණන වැඩසටහන් 12 ක් සැලසුම් කරන ලද අතර ඒවා සියල්ලම සිදු කර අවසන් කිරීමට හැකි විය . ඊට අමතරව අංශයට ලබා දුන් විමර්ශනමය කාර්යයන් හා සුවිශේෂි විගණන කාර්යයන් 02 ක් මෙම වර්ෂයේ ඉටු කර ඇත. 2019 වර්ෂයේ සැලසුම් කළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ම පවත්වන ලදී.

**වෙනත් :**

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය පටු වීම හා ඉංජිනෙරුමය දැනුම සහිත අයවලුන් ගෙන් අංශය සන්නද්ධ නොවීම යනාදිය ප්‍රධාන සංරෝධකයන් විය.